# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | ඉතිහාසය | 2 ඒකකය |
|---|---|---|

### ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවය.

01. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරටට පැමිණි මිෂනාරී සංවිධාන විසින් ප්‍රචාරය කරන ලද්දේ,
   1. ඉස්ලාම් ආගම
   2. ක්‍රිස්තියානි ආගම
   3. රෝමානු කතෝලික ආගම
   4. රෙපරමාදු ආගම

02. මිෂනාරීන් විසින් සිය ආගම ප්‍රචාරය සඳහා මුද්‍රණය කරන ලද ප්‍රකාශනයක් නොවන්නේ,
   1. උරගල
   2. ලංකා නිධානය
   3. මාසික තෑග්ග
   4. ලක්මිණි පහන

03. සුප්‍රසිද්ධ පංචමහා වාද අතරින් ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත් වූයේ,
   1. වරාගොඩ වාදය
   2. පානදුරා වාදය
   3. උදම්මිට වාදය
   4. බද්දේගම වාදය

04. සිදත් සඟරා සන්නස, කාව්‍යශේකර සන්නස ආදී පොත්පත් රැසක් රචනා කරන ලද්දේ,
   1. ධම්මාලෝක හිමියන් ය.
   2. ගුණානන්ද හිමියන් ය.
   3. සුමංගල හිමියන් ය.
   4. සිද්ධාර්ථ හිමියන් ය.

05. කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ අනුව ප්‍රථම උගත් ලාංකික මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත් වූයේ,
   1. පොන්නම්බලම් අරුණාචලම් මහතා
   2. පොන්නම්බලම් රාමනාදන් මහතා
   3. ටී.බී. ජයා මහතා
   4. සිද්දි ලෙබ්බේ මහතා

06. 1933 වසරේ ඉන්දියාවේ සාරානාත්හි දී ''සිරිදේවමිත්ත'' නමින් අපවත් වූයේ,
   1. අනගාරික ධර්මපාලතුමා
   2. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
   3. පියදාස සිරිසේන මහතා
   4. ජෝන් ද සිල්වා මහතා

07. කොළඹ තරුණ බෞද්ධ සංගමය පිහිටු වීමට පුරෝගාමී වෙමින් තරුණ පිරිස තුළ ජාතික හැඟීමක් ඇති කළේ,
   1. අනගාරික ධර්මපාලතුමා
   2. වලිසිංහ හරිස්චන්ද්‍ර මහතා
   3. ඩී.බී. ජයතිලක මැතිතුමා
   4. ජෝන් ද සිල්වා මහතා

08. 1915 සිංහල-මුස්ලිම් කෝලාහල අවස්ථාවේ දී ආණ්ඩුවෙන් බෞද්ධයන්ට සිදු වූ අසාධාරණයේ දී බෞද්ධයන් වෙනුවෙන් හඬ නැගුවේ,
   1. පොන්නම්බලම් රාමනාදන් මහතා
   2. පොන්නම්බලම් අරුණාචලම් මහතා
   3. සිද්දි ලෙබ්බේ මහතා
   4. ටී.බී. ජයා මහතා

EXAMRESULTS.LK

09. ඉංග්‍රීසීන් විසින් ඊජිප්තුවෙන් පිටුවහල් කරන ලද ඔරබි පාෂා ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයට සහයෝගය ලබා දුන් අතර ඔහු ලංකාවට පැමිණි වර්ෂය වන්නේ

1. 1857 වර්ෂයේ දී.
2. 1838 වර්ෂයේ දී.
3. 1883 වර්ෂයේ දී.
4. 1388 වර්ෂයේ දී.

10. මුස්ලිම් දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කරන ලද්දේ,

1. ඔරබි පාෂා
2. සිද්දි ලෙබ්බේ
3. ටී.බී. ජයා
4. ආරුමුග නාවලර්තුමා

- **දී ඇති පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.**

11. ක්‍රිස්තියානි සභාවට අයත් ආගම ප්‍රචාරය කිරීමේ සේවය ....................................... සේවය නමින් හැඳින්වේ.
12. ක්‍රිස්තියානි පූජකවරුන් හා භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ ....................................... නිසා බුදු දහම බටහිර රටවල පවා ප්‍රකට විය.
13. ඇමරිකානු ජාතික ....................................... ලංකාවට පැමිණ බුදු දහම වැළඳ ගත්තේ මෙම වාද විවාදවල තොරතුරු දැන ගැනීමෙනි.
14. රුසියානු ජාතික ....................................... මැතිණිය ද බුදු දහම පිළිබඳ තොරතුරු සොයා ලංකාවට පැමිණියා ය.
15. ලංකාවේ ප්‍රථම බෞද්ධ පුවත්පත වන්නේ ....................................... ය.

(පංචමහා වාද / බ්ලැවැට්ස්කි / ලක්මිණි පහන / ඕල්කට්තුමා / මිෂනාරි / ලංකා නිධානය)

- **පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. පිරිවෙන් පිහිටුවීම මෙරට බෞද්ධ පුනර්ජීවනයේ කැපී පෙනෙන ලක්ෂණයකි. (    )
17. ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉංග්‍රීසි බෞද්ධ පාසල ආනන්ද විද්‍යාලයයි. (    )
18. ඉස්ලාම් සිසුන් හට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීම සඳහා 1872 වර්ෂයේ දී යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ විය. (    )
19. 1873 වර්ෂයේ දී මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීම පූජ්‍ය රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමියන් විසින් සිදු විය. (    )
20. යාපනයේ ශෛව ප්‍රකාශ විද්‍යා ශාලෛ යනුවෙන් පාසලක් ඇරඹීමට සිද්දි ලෙබ්බේ මහතා පියවර ගත්තේ ය. (    )

## II කොටස

01\. 1. 19 සියවස මුල් භාගයේ දී ලංකාවට පැමිණි මිෂනාරි සංවිධාන 3ක් ලියන්න. (ල.03)

2\. මිෂනාරි සංවිධාන විසින් ආගම ප්‍රකාරය සඳහා යොදා ගත් මාධ්‍ය මොනවාදැයි කෙටියෙන් සඳහන් කරන්න. (ල.03)

3\. විවිධ උපාය මාර්ග අනුගමනය කරමින් මිෂනාරි සංවිධාන ලංකාව තුළ කරන ලද කටයුතු මොනවාද? (ල.04)

4\. මිෂනාරි අධ්‍යාපනය නිසා මෙරට සිදු වූ යහපත් ප්‍රතිඵල මොනවාදැයි සඳහන් කරන්න. (ල.02)

02\. 1. 19 සියවස අග භාගය වන විට ලාංකිකයන් තුළ ආගමික ප්‍රබෝධයක් ඇති වීමට බලපෑ හේතු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

2\. මෙරට බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 5ක් ලියන්න. (ල.05)

3\. පහත නම් සඳහන් භික්ෂූන් වහන්සේලා විසින් ඉදි කරන ලද පිරිවෙන් මොනවාද? (ල.02)

a. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි -

b. පූජ්‍ය රත්මලානේ ධර්මාලෝක හිමි -

03\. 1. ලංකෝපකාර මුද්‍රණාලය පිහිට වූයේ කොහේද? කවදාද? (ල.02)

2\. පංච මහා වාද අතරින් පහත දැක්වෙන වර්ෂවල දී පැවැත්වුණු වාද නම් කරන්න. (ල.02)

a. 1865 -

b. 1873 -

3\. බෞද්ධ පුනරුද ව්‍යාපාරය තුළින් සිදු වූ වැදගත් කටයුතු මොනවාද? (ල.03)

4\. එම ව්‍යාපාරය ආරම්භ කළ නිසා පරමවිඥානාර්ථ සමාගමේ මැදිහත් වීමෙන් බිහි වූ පාසල් 5ක් නම් කරන්න. (ල.05)

04\. 1. ඕල්කට්තුමාගෙන් සිදු වූ සේවාවන් 4ක් දක්වන්න. (ල.04)

2\. ධර්මපාලතුමාගෙන් සිදු වූ සේවාවන් 4ක් දක්වන්න. (ල.04)

3\. දේශීය සංස්කෘතිය ආරක්ෂා කරගැනීමට කටයුතු කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

05\. 1. හින්දු පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ කෙටියෙන් සඳහන් කරන්න. (ල.03)

2\. හින්දු පුනරුද ව්‍යාපාරයට ආරුමුග නාවලර්තුමාගෙන් සිදු වූ වැදගත් කාර්යයන් 2ක් සඳහන් කරන්න. (ල.02)

3\. ආරුමුග නාවලර්තුමාගේ අභාවයෙන් පසු හින්දු පාසල් පිහිටුවීමේ ව්‍යාපාරය ඉදිරියට මෙහෙය වූ නායකයන් 2ක් නම් කරන්න. (ල.02)

4\. මෙරට ඉස්ලාම් පුනරුද ව්‍යාපාරය සඳහා සිද්දි ලෙබ්බේ මහතා කළ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න. (ල.05)

*සැකසුම: ප්‍රමෝදා හේවාවිතාරණ මිය*